රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2022

මගේ අංකය : EST-6/03/LEA/1060
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.06. 10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කිරීම

පවතින ප්‍රවාහන අපහසුතා සහ විදුලිය නොමැති අවස්ථාවන්හි දී කාර්යාල කටයුතු පවත්වාගෙන යාමේ දී මුහුණදෙන ගැටලු සැලකිල්ලට ගෙන දැනටමත් රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති එළඹෙන ජුනි මස 14 අඟහරුවාදා දිනයට පෙර යෙදෙන ජුනි මස 13 සඳුදා දිනය ද රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරමි.

02. තව ද, රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු ය.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය